**සීතාවකපුර නගර සභාව - 2023**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීතාවකපුර නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සීතාවකපුර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණ නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම.

| | **අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ අංක 3.28 ප්‍රකාරව හා එහි පරිශිෂ්ඨය 2 හි පහදා දීම් හා මගපෙන්වීම්හි EG 6.2 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ආයෝජන ආදායම් ලෙස රු.3,485,722 ක් අඩුකළ යුතු වුවත් රු. 3,857,151 ක් එකතු කිරීම හේතුවෙන් එම මුදල් ප්‍රවාහය රු.7,342,873ක් වැඩියෙන් ද එකතු කළ යුතු වාර්ෂික ක්ෂය රු.23,375,705 ක් වෙනුවට රු.21,995,916 ක් එකතු කිරීම හේතුවෙන් එම මුදල් ප්‍රවාහය රු.1,379,789 ක් අඩුවෙන් ද පෙන්වා තිබුණි. | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී නිවැරදිව කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශන නිවැරදිව සකස් කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ අංක 3.29 ප්‍රකාරව හා එහි පරිශිෂ්ඨය 2 හි පහදා දීම් හා මගපෙන්වීම්හි EG 6.3 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ලැබු පොලී වශයෙන් රු.2,109,699ක් එකතු කළ යුතු වුවත් රු.3,857,151 ක් එකතු කිරීම හේතුවෙන් එම මුදල් ප්‍රවාහය රු. 1,747,452ක් වැඩියෙන් ද දේපළ පිරියත හා උපකරණ මිලට ගැනීම සඳහා වැයකළ රු.4,228,672ක් අඩුවිය යුතු වුවද රු.6,159,751ක් එකතු කිරීම හේතුවෙන් එම මුදල් ප්‍රවාහය රු.10,388,423 ක් වැඩියෙන් ද පෙන්වා තිබුණි. | **එම** | **එම** |

| | | |
|---|---|---|
| (ඇ) ප්‍රමිතියේ අංක 3.30 ප්‍රකාරව හා එහි පරිශිෂ්ඨය 2 හි පහදා දීම් හා මගපෙන්වීම්හි EG 6.4 ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී දිගුකාලීන ණය ගැනීම් ආපසු ගෙවීම් රු.7,221,607ක් අඩු කළ යුතු වුවද රු.414,925 ක් අඩු කිරිම හේතුවෙන් එම මුදල් ප්‍රවාහය රු.6,806,682ක් වැඩියෙන් පෙන්වා තිබුණි. | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී නිවැරදිව කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශන නිවැරදිව සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 වර්ෂයේ ස්ථාවර වත්කම් රු.1,986,381 ක් වැඩියෙන් ක්ෂය කිරිමේ වරද සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදී වත්කම් ගිණුම හරකර ක්ෂය වෙන්කිරීමේ ගිණුම බැරකර තිබුණි. | 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ දී නිවැරදි කරන බව. | ගිණුම්ගත කිරිම නිවැරදිව කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාහන ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය 2,120,898 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල රු14., 328,438ක් ලෙස දැක්වීම හේතුවෙන් දේපළ පිරියත හා උපකරණ වල වටිනාකම රු.12,207,540 ක් අඩුවෙන් දැක්වේ. | එම | එම |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ වාහන ක්ෂය රු.3,761,378 ක් වුවද, මූල්‍ය ප්‍රකශනවල රු.2,380,887 ක් ලෙස ගිණුම්ගත වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.1,380,491 ක් වැඩියෙන් දක්වා තිබුණි. | එම | එම |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු වටිනාකම රු. 28,294,770 වුවද මූල්‍ය ප්‍රකාශන වල රු. 28,364,065 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර තැන්පතු වටිනාකම රු.69,295ක් වැඩියෙන් දක්වා තිබුණි. | එම | එම |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 1,553,645ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනයේ රු.1,042,802 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.510,843ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ දී නිවැරදි කරන බව. | ගිණුම්ගත කිරිම නිවැරදිව කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.3,485,723 ක් වුවත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ රු. 2,835,419 ක් ලෙස දැක්වීම හේතුවෙන් හුවමාරු ගණුදෙනු වලින් වන අයභාරය රු.650,304 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථාවර තැන්පත් පොලී ආදායමට අමතරව සේවක ණය පොලියද මෙම ආදායම් විෂයයට ඇතුලත් වී ඇත. ඒ අනුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හුවමාරු වන ගනුදෙනු වලින් වන අයභාරය වැඩිපුර ගිණුම්ගත කර නොමැති බව. | ගිණුම්ගත කිරීම නිවැරදිව කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) නගර සභා ආඥා පනත 132 වගන්තිය | අඥා පනත යටතේ පිහිටුවීමට හෝ පවත්වා ගෙන යාමට බලය දී තිබෙන යම් මහජනෝපකාර සේවයක් පිහිටුවීමේ හෝ පවත්වාගෙන යාමේ කාර්යය සඳහා එම නගර සභාව විසින් යම් ගිවිසුමකට එළඹිය හැකි වුවත් මධ්‍යම බස් නැවතුම්පොල භූමියේ ඇති වැසිකිළි දෙකක ආදායම් රැස් කිරීම ලිඛිත ගිවිසුමකින් තොරව බාහිර පාර්ශවයකට පවරා තිබුණි. | මධ්‍යම බස්නැවතුම්පලහි පිහිටි වැසිකිළි දෙකෙන් පෞද්ගලික බස් නැවතුම්පලට මුහුණලා ඇති වැසිකිළිය 2018 වසරේ සහ පූගොඩ බස් නැවතුම්පලට මුහුණලා ඇති වැසිකිළිය 2019.06.12 දින සභාපති වරයාගේ නියෝගය පරිදී ලබාදීමට කටයුතු කර ඇති බව. | ලිඛිත ගිවිසුමකට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) 2017 දෙසැම්බර් 12 දිනැති අංක 02/2017 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය 2017 අංක 02 | 2021 වර්ෂයේදී මුල්ලේරියාව කොටිකාවත්ත ප්‍රාදේශීය සභාවෙන් ලැබී තිබූ මිට්ෂුබිෂි ඩබල් කැබ් රථය සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් මඟින් සභාව වෙත පවරා දීමට කටයුතු සිදු කරමින් පවතින බව. | වත්කම් පවරා ගැනීම කඩිනමින් සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ වියදම රු.5,792,630 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.15,143,714 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 32,285 | 33,816 | 21,243 | 12,573 | 32,211 | 32,142 | 22,543 | 28,955 |
| (ii) | කුලී | 56,454 | 41,882 | 37,640 | 4,241 | 41,165 | 31,367 | 33,607 | 4,490 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,297 | 569 | 569 | 0 | 1,293 | 237 | 1,095 | - |
| (iv) | වෙනත් ආදායම් | 46,620 | 34,710 | 16,736 | 17,974 | 13,407 | 30,821 | 13,206 | - |
| | | 136,656 | 110,977 | 76,188 | 34,789 | 88,076 | 94,567 | 70,451 | 33,445 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශවල 2023 දෙසැම්බර් 31 දිනට සභාවට අය විය යුතු හිඟ වරිපනම් බදු ආදායම රු.27,254,299 ක ශේෂයක් විය. | 2023.12.31 දක්වා හිඟ රු. 27,786,522 න් රු.532,223 ක් 2024.03.27 දක්වා අයකරගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල අයකර ගැනීම සඳහා දේපල තහනම් නිළධාරි වෙත හිඟ ලැයිස්තු ලබා දීමට කටයුතු කර ඇති බව. | හිඟ වරිපනම් බදු අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) (i) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩකුලී ආදායම රු2,580,984 ක් වී තිබුණි. | හිග අය කර ගැනීම සඳහා ඉදිරි කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි | හිඟ කඩකුලී අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) 2023 දෙසැම්බර් 31 දිනට සභාවට අය විය යුතු හිඟ තානායම් කුලිය රු.9,181,373 ක් විය. | හැකි ඉක්මනින් මෙම ගෙවීම් සිදුකරන බවට එකඟ වී ඇති බව. | හිඟ තානායම් කුලී අයකිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) (i) 2023 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි දඩ මුදල් ආදායම රු.215,643 ක් විය. | එම හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින අතර 2023.12.31 දිනට හිග රු.299,655 ක දඩ මුදලින් 2024 ජනවාරි හා පෙබරවාරි මාසයන් වල රු.84,012 ක අයකර ඇති බව. | හිඟ දඩ මුදල් අයකර ගැනීමට සභාව කටයුතු කළයුතුය. |
| (ii) විනෝද බදු වශයෙන් රු.516,862ක් දෙසැම්බර් 31 දිනට නිරවුල් කරගෙන නොතිබුණි. | විනෝද බදු ලේඛනයට අනුව එබදු හිඟයක් නොමැති බව. | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (iii)පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.299,655ක් හා මුද්දර ගාස්තු රු.14,368,529 ක් විය. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී මෙම මුදල් ඇස්තමේන්තු කර ඇති අතර හිඟය පිළිබඳව නිශ්චිතව සඳහන් කිරීමට නොහැකි බව. | අදාල ගාස්තු නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය ප්‍රකාර රජයේ නිල නිවාසයක පදිංචි කාලය වසර 05ක් විය යුතු වුවත් නගර සභාව වෙත පරිපාලන අයිතිය පැවරී ඇති නිල නිවාස 07ක එකම නිලධාරීන් වසර 07 ක සිට වසර 29 ක් දක්වා කාල පරාසයක පදිංචිවී සිටින අතර එම නිලධාරීන්ගේ ගිවිසුම් කාලය වසර 02ක සිට වසර 06 ක කාලයක් ගතවුවද එම අදාල ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. | නිල නිවාස 07 න් නිවාස 06 ක ගිවිසුම්ගත කාලය ඉක්මවා ගිවිසුමකින් තොරව සේවකයින් පදිංචිව සිටින අතර මෙම නිල නිවාසවල නීත්‍යානුකූල අයිතිය පවරා දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කටයුතු කරන බව දන්වා ඇති බව හා වසර 5 ඉක්මවා නිල නිවාසවල පදිංචිව සිටින සේවකයින් ඉවත් කිරීමටත් පොරොත්තු ලේඛනයේ සිටින සේවකයින් සඳහා නිල නිවාස ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | නිල නිවාස වල නීතියානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර ගිවිසුම් යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2022 ජනවාරි 02 දින විශ්‍රාම ගන්වන ලද නිලධාරියකු එසේ නිල නිවාසය ආපසු භාරදීමකින් තොරව වසර 02 කට වැඩි කාලයක් පදිංචිව සිටින අතර එම නිවාස ආපසු ලබා ගැනීමට (1978 අංක 42 දරන පළාත් පාලන ආයතන නිල නිවාස පනතේ) විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | ඔහු විශ්‍රාම යාම සඳහා ඉල්ලීම් කිරීමේ දී නිල නිවාසය සභාවට භාර දෙන ලෙස දැනුවත් කල ද එය භාරනොදීම නිසා ඔහුගේ විශ්‍රාම වැටුප් ගෙවීම ද ප්‍රමාද වී ඇත. එසේම මෙම නිල නිවාස පිහිටි ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | නිල නිවාස වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 1988 වර්ෂයේ සිට අයවිය යුතු පෞද්ගලික බස්ගාල් ගාස්තු වටිනාකම රු.230,700ක් විය. | මෙම මුදල වැරදීමකින් බිල් කර ඇති බැවින් අය කර ගත නොහැකි ශේෂයක් ලෙස හඳුනාගෙන කපා හැරීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කර ඇති බව. | ශේෂයන්ගේ නිවැරදිතාවය තහවුරු කර ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 16 දිනැති අංක 2311 දරන ගැසට් නිවේදනයේ iv (ආ) වැනි කොටසේ 2023 වර්ෂය සඳහා මෝටර් වාහන ගාස්තු පැනවීමට අදාළ 12-325/13 ඡේදය ප්‍රකාර ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය අනුව මාසිකව රු. 250 ක් ත්‍රෛමාසිකව රු.650 ක්, හා වාර්ෂිකව රු.2000 ක් බැගින් ත්‍රී රෝද රථ නවතා තැබීමේ අවසර පත්‍ර ගාස්තුවක් අය කිරීමට කටයුතු කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා ගාස්තු කිසිවක් අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. සභාවේ ලියාපදිංචි වූ ත්‍රී රෝද රථ සංඛ්‍යාව 623 ක් වූ අතර මේ හේතුවෙන් සභාවට අහිමි වූ වාර්ෂික ආදායම රු.1,246,000 ත් රු.1,869,000 ත් අතර අගයක් අහිමි වී තිබුණි. | ත්‍රීරෝද රථ අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීමෙන් අනතුරුව රථගාල් 13 යටතේ සංගම් 20ක් සභාවේ ලියාපදිංචි වන ලදී. ත්‍රිවිල් සංගම් වල වාර්තාවන් කැඳවා එම සංගම් සක්‍රීය මට්ටමේ පවතීනම් අවසර පත්‍ර නිකුත් කර ගාස්තු අයකිරීමටත් එසේ බලපත්‍ර නොගන්නා ත්‍රීරෝද රථ පොලීසිය මගින් ඉවත් කිරීමට පියවර ගනු ඇති බව. | ආදායම් රැස්කර ගැනීමට සභාව කටයුතු කළ යුතුය. |
| (ආ) 2022 දෙසැම්බර් 16 දිනැති අංක 2311 දරන ගැසට් නිවේදනයේ iv (ආ) වැනි කොටසේ 12-325/8 ඡේදය ප්‍රකාරව වෙන් කර ඇති පෞද්ගලික රථ ගාලෙන් පිටත වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අයකිරීම සඳහා ගාස්තු නිර්ණය කර තිබුණද එපරිදි කටයුතු කර නොතිබුණි. | වාහන නවත්වන ස්ථාන හඳුනාගෙන එම ස්ථාන වලින් මෙන්ම නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමෙන් පසු ස්ථාපිත කරන අමතර රථගාල් වලින් ගාස්තු අයකිරීමට කටයුතු කරනු ඇති බව. | රථගාල් ගාස්තු විධිමත් පරිදි අයකර ගත යුතුය. |
| (ඇ) බස්නැවතුම්පොළ උඩු මහල පිහිටි U කඩ කාමර 35 ක් සඳහා රු. 38,511,660 ක ටෙන්ඩර් මුදලකට අනුමත කර තිබූ අතර එම ටෙන්ඩර්කරුවන්ගෙන් 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.9,571,107 ක මුදලක් සභාවට ගබාගෙන තිබූ නමුත් 2023 ඔක්තෝම්බර් 10 දින වන විටද, එම කඩ කාමර ඉදිකිරීම් සැලසුම්කර වර්ෂ 11ක් ගත වී ඇතත් එම ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. | බස් නැවතුම්පල උඩුමහල (U) කඩ කාමර ඉදිකිරීමට ටෙන්ඩර් කර එකවර ගෙවිය යුතු මුදල් අයකර ඇති බව. | ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |
| (ඈ) පොදු බස් නැවතුම්පොල උඩුමහලේ කඩ කාමර 11 සඳහා 2022 වර්ෂයේදී රු.4,600,000 කට අවම ටෙන්ඩර් මිල තීරණය කර මාසිකව රු.70,000 ක කුලී මුදලකට තක්සේරු කර තිබුණද මෙම කඩ කාමර 2012 වර්ෂයේ සිටම බදු දීමට සභාව කටයුතු කර නොතිබීම හේතුවෙන් 2012 වර්ෂයේ | මෙම කඩ කාමර 11 සඳහා 2017 වර්ෂයේ සිටම ටෙන්ඩර් කළද ඒ සඳහා ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් නොවිණි. එසේම පළාත් පාලන කොමසාරිස්ගේ LGD/13/2016(I) චක්‍රලේඛයට අනුව ටෙන්ඩර් පටිපාටියෙන් | කඩ කාමර බදු දී ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සිට මෙම කඩ කාමර වලින් ලබා ගත හැකිව තිබූ ආදායම සභාවට අහිමි වී තිබුණි. | තොරව බදු දීමට හැකියාවක් නොමැති බැවින් නගර සභාව මගින් පවත්වාගෙන යනු ලබන පරිගණක පන්තියක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බව. | |
| (ඉ) බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ අංක /13/2016 දරන 2016 නොවැම්බර් 09 දිනැති චක්‍රලේඛයට අනුව පළාත් පාලන ආයතනයට අදාළව බදු ගිවිස ගන්නට යෙදෙන සෑම ගොඩනැගිල්ලකට, ඉඩමකට අදාළව ගිවිස ගත් දිනෙන් සෑම වසර තුනකට වරක් මාසික කුලිය රජයේ තක්සේරුකරුගේ හෝ වරලත් තක්සේරුවකුගේ තක්සේරු මත ප්‍රතිශෝධනය විය යුතු වුවත් සභාව සතු කඩකාමර 214ක තක්සේරු වාර්තා වසර 3 ක කාලය ඉක්මවා තිබූ අතර, එම තක්සේරු වාර්තා පදනම් කරගෙන කඩකුලී ආදායම් ලබාගෙන තිබීම හේතුවෙන් සභාවට තව දුරටත් ලබාගත හැකිව තිබූ කඩකුලී ආදායමක් අහිමි වී තිබුණි. | කඩ කාමර සඳහා ගිවිස ගනු ලැබූ බදු කාල සීමාව ඉක්මවීමට ප්‍රථම අදාල නව කඩ කුලී තක්සේරුව ලබා දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇතත් එම තක්සේරුව මෙතෙක් ඉදිරිපත් වී නොමැති බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවිස්සාවේල්ල නව වෙළඳ සංකීර්ණයේ R 09 කඩ කාමරයේ බදුකරු මිය යාම හේතුවෙන් බදු ගිවිසුමකින් තොරව තෙවන පාර්ශවයක් වෙත මෙම කඩ කාමරයේ වෙළඳ අයිතිය අනියම් ආකාරයෙන් පවරා දී තිබූ අතර 2017 ඔක්තෝබර් මස සිට අදාළ මාසික බදු කුලියද අය කිරීමට කටයුතු කර නොතිබුණි. එහි බදු අයිතිය පැවරීමට ප්‍රසම්පාදනය මගින් නව බදුකරුවෙකු තෝරාගන්නා ලෙසට පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් උපදෙස් ලබාදී තිබියදී 2020 දෙසැම්බර් 03 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ LGD/13/2016 (i) චක්‍රලේඛයේ උපදෙස් කඩකරමින් අතුරු බදු දීමට කටයුතුකර තිබුණි. ඒ අනුව වාර්ෂික තක්සේරුව මත අයකරන මාසික බදු කුලිය මෙන් 60 ගුණයක පැවරම් ගාස්තුවක්ද, හිඟ හිටි බදු කුලී රු.8,006,180 හා ඇප තැන්පතු 72,000 ක් අයකර කඩ කාමරය භුක්ති විඳිමින් සිටි පාර්ශවයට සභාව විසින් 2023 ජුනි 21 දින සිට බදු පදනමට පස් වසරකට ගිවිසුම්ගත වී තිබුණි. | කඩ කාමරය සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශනයක් හා අධිකරණ ක්‍රියා මාර්ගයන් සිදු වෙමින් පවතින අතර මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කළ යුතු ආකාරය හා ගිවිසුමේ වලංගුභාවය පිළිබඳව පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් විමසීමක් කළ අතර කඩ කාමරය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන බව. | නීතිමය උපදෙස් පරිදි ඉදිරි කටයුතු කළයුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| ත්‍රී රෝද රථය වර්ෂ 07ක කාලයක සිට අක්‍රිය තත්වයේ පවතුණි. | නිෂ්පාදනය කර වර්ෂ 10 ක කාලය ඉක්මවා ඇති බැවින් අපහරණය කිරීම සම්බන්ධව සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා 2023.12.21 දින පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත දැනුම් දී ඇති බව. | අපහරණ කටයුතු අප්‍රමාදව සිදු කළ යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව හඳුනාගෙන තිබූ දේපළ අයිතම 134 න් 117ක ප්‍රමාණයක් සභාව නමින් පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | නගර සභාව සතු බවට හඳුනා ගන්නා ලද දේපල අතුරින් නීත්‍යානුකූල නොවූ දේපල සම්බන්ධයෙන් පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | දේපල නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සභා බල ප්‍රදේශය තුල පොදු පහසුකම් සඳහා වෙන්කර ඇති ඉඩම් ගොඩනැගිලි 17 ක නියැදියක් භෞතික පරීක්ෂාවට ලක් කළ අතර ඉන් 03 ක අනවසර ඉදිකිරීම් සිදුකර තිබූ අතර අදාල පාර්ශ්වයන් සම්බන්ධයෙන් සභාව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාල පාර්ශවයන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය ලේඛන සභාව සතුව නොමැති බැවින් ඉදිරි කටයුතු සිදුකිරීම ගැටළුකාරී තත්ත්වයක පවතින බව. | පොදු පහසුකම් සහිත ඉඩම්වල නීත්‍යානුකූලභාවය තහවුරු කර ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**තිරසාර සංවර්ධන අරමුණු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| කාර්යයසාධන දර්ශක 63 න් 29 ක් සඳහා ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රතිශත කොතෙක්ද යන්න කාර්යයසාධන වාර්තාවට ඇතුලත් කර නොතිබුණි. | 2024 වර්ෂයේදී මෙම ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කරන බව. | ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළයුතුය. |